**ආර්ථික විද්‍යාව - 12 පාඩම - ශ්‍රී ලංකාවේ ආර්ථික ව්‍යුහය හා ප්‍රතිපත්ති**

1.)1961-1977 අවධියේ ශ්‍රී ලංකා ආර්ථිකයේ දැකිය හැකි ලක්ෂණයක් නොවන්නේ,

1.අභ්‍යන්තරාභිමුඛ ආර්ථික ප්‍රතිපත්ති ක්‍රියාත්මක වීම.
2.ආනයන පාලනය
3.විනිමය පාලනය හා ආනයන පාලනය ඉවත් කිරීම.
4.අපනයන විවිධාංගීකරණය
5.දේපළ හා වත්කම් ප්‍රතිව්‍යාප්ත කිරීම.

2.) ශ්‍රී ලංකා ආර්ථිකය සඳහා විවෘත ආර්ථික ප්‍රතිපත්ති හඳුන්වා දෙන ලද්දේ කුමන අවධියේදී ද?

1.) 1948-1960 දක්වා අවධිය
2.) 1965-1970 දක්වා අවධිය
3.) 1961-1977 දක්වා අවධිය
4.) 1977-1994 දක්වා අවධිය
5.) 1994-2015 දක්වා අවධිය

3.) මහින්ද චින්තන දස අවුරුදු දැක්ම අනුව ශ්‍රී ලංකාවේ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ජාතික මට්ටමින් ක්‍රියාත්මක වූ වැඩසටහන වන්නේ,

1.මග නැගුම
2.දිරි නැගුම
3.ගම නැගුම
4.ගැමි දිරිය
5.රන්දොර

4.) ශ්‍රී ලංකාව ආසියාවේ ආශ්චර්ය බවට පත් කිරීමට ප්‍රධාන වෘද්ධි කේන්ද්‍ර හයක් ස්ථාපිත කර ඇත.ඒවා අතරට අයත් නොවන්නේ,

1.මූල්‍ය කේන්ද්‍රස්ථානය
2.දැනුම කේන්ද්‍රස්ථානය
3.ගුවන් කේන්ද්‍රස්ථානය
4.සංචාරක කේන්ද්‍රස්ථානය
5.බලශක්ති කේන්ද්‍රස්ථානය

5.)නිර්බාධිකරණ ප්‍රතිපත්තියේ මූලික ලක්ෂණයක් නොවන්නේ,

1.පෞද්ගලික අංශයේ කාර්යභාරය පුළුල් කිරීම.
2.මිල පාලනය දැඩි කිරීම.
3.නම්‍ය විනිමය අනුපාත ක්‍රමයක් හඳුන්වා දීම.
4.විදේශ විනිමය ලිහිල් කිරීම.
5.විදේශ ආයෝජන දිරිමත් කිරීම.

6.)2019 වර්ෂයේ ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය,

1.)2.3%
2.)4.8%
3.)3.1%
4.)3.4%
5.)2.5%

7.)2019 වර්ෂයේ ශ්‍රී ලංකාවේ සේවා නියුක්ති දායකත්වය කෘෂි,කාර්මික හා සේවා අංශ සඳහා පිළිවෙලින් දක්වා ඇති වරණය වන්නේ,

1.)20.75% , 42.5% ,36.75%
2.)25.5% ,27.9% ,46.6%
3.)49.5% ,30.6% ,19.9%
4.)27.9% ,46.6% ,25.5%
5.)25.3% ,27.6% ,47.1%

8.) 2019 වර්ෂයේ ශ්‍රී ලංකාවේ සේවා නියුක්ති අනුපාතිකය වන්නේ,

1.)3.2%
2.)4.8%
3.)5.3%
4.)4.4%
5.)7.3%

9.)MCC ගිවිසුම මගින් ශ්‍රී ලංකාවට ලැබෙන මුදල් උපයෝජනය කළ යුතු ප්‍රධාන ක්ෂේත්‍රයන් වන්නේ,

1.සන්නිවේදනය හා ඉඩම් ප්‍රතිසංස්කරණ
2.අධ්‍යාපනය හා සෞඛ්‍ය
3.ප්‍රවාහන ක්ෂේත්‍රය ප්‍රතිසංස්කරණය හා කෘෂි කර්මාන්තය
4.ඉඩම් ප්‍රතිසංස්කරණය හා ප්‍රවාහන ක්ෂේත්‍රය ප්‍රතිසංස්කරණය
5.ඉඩම් ප්‍රතිසංස්කරණය හා වරාය සංවර්ධනය

10.)2018 වර්ෂයේ ශ්‍රී ලංකාවේ මානව සංවර්ධන දර්ශකයේ අගය කොපමණද?

1.)0.125
2.)0.783
3.)0.894
4.)0.531
5.)0.702

<u>පිළිතුරු</u>

| | |
|---|---|
| **1.)** 3 | **6.)** 1 |
| **2.)** 4 | **7.)** 5 |
| **3.)** 5 | **8.)** 2 |
| **4.)** 1 | **9.)** 4 |
| **5.)** 2 | **10.)** 2 |

**සකස් කළේ,**

**ආර්.එම්.එස්.ධර්මවර්ධන මිය,**
**ර/මල්වල මහා විද්‍යාලය.**